www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# දෙවන ජුවාම් පාවුලු පාප්: දේශපාලන අභාවනුකථනයක්

## Pope John paul ii: a political obituary

**මාරියස් හුසර් සහ පීටර් ශ්වාර්ට්ස් විසිනි**
**2005 අප්‍රේල් 06**

දෙවන ජුවාම් පාවුලු පාප් සමකාලීන සාන්තුවරයෙකු ලෙස පින්තාරු කරමින් ද වතිකානු අවමංගල්‍ය යාතු කර්මවල පම්පෝරිය සහ මිථ්‍යාව අවිවේචනාත්මකව ඉදිරිපත් කරමින් ද සිදු කෙරුනු මාධ්‍ය වෙඩි සැර මැද්දේ දෙවන ජුවාම් පාවුලුගේ පෞද්ගලික ගතිගුන පිලිබඳව හෝ සමකාලීන ඉතිහාසයේ ඔහුගේ සැබෑ භූමිකාව පිලිබඳව හෝ බැරෑරුම් යමක් නොතිබුන තරම් ය. කැරොල් ජෝශප් වොජ්ටිලාගේ ජීවිතය පුරා බලපැවැත්වූ සහ ඔහුගේ 27 අවුරුදු පාප් ධූරය වෙලා ගත් දේශපාලන කාරනා සාකච්ඡා කෙරුනේ සුලු වසයෙනි.

පලමුව ප්‍රොතෙස්තන්ත ප්‍රතිසංස්කරනයට එරෙහි වෙමින් වැඩවසම් පර්යායේ මුක්කුවක් ලෙස ද පසුව ධනේශ්වර පාලනයේ පවුරක් ලෙස ද රෝමානු කතෝලික පල්ලිය සියවස් ගනනාවක් මුලුල්ලේ දේශපාලන ප්‍රතිගාමිත්වයේ පදනම් ගලව පවතී. පල්ලියේ මුල් පුටුවේ වාඩි ගන්නා පුද්ගලයාගේ පෞද්ගලික ගතිගුන කෙසේ වතුදු ඔහුගේ භූමිකාව දැඩි ලෙසින් ම දේශපාලනික වේ.

ධනවාදී රාජ්‍යයන් සහ ස්ටැලින්වාදී පාලන තන්ත්‍රයන් සමග එක ලෙසින් ගනුදෙනු කරමින් ලබා ගත් සැලකිය යුතු අත්දැකීම් සහිතව දේශපාලනය හා ආගම යන දෙකෙහි ම ගැඹුරින් ම ප්‍රතිගාමී වූ දෘෂ්ටීන් ඒකාබද්ධ කල පුද්ගලයෙකු දෙවැනි ජුවාම් පාවුලු තුලින් පාප් ධූරය සඳහා ලැබිනි. පසු ගිය සියවස් කාලක සිදු වූ ප්‍රකම්පිත සිද්ධීන් තුල දී ප්‍රධාන භූමිකාවක් ඉටු කිරීමට ඔහු එම අත්දැකීම් ගොනු කර යොදවා ගත්තේ ය.

1920 මාර්තු 18 වන දා පෝලන්තයේ වදෝවිස් නම් කුඩා නගරයේ දී ඕස්ත්‍රියානු අධිරාජ්‍යයේ සේවය කල නිලධාරියෙකුගේ පුතෙකු ලෙසින් කැරොල් ජෝශප් වොජ්ටිලා උපත ලැබී ය. වයස අවුරුදු 9 දී මව අහිමි වූ ඔහුට වයස 21 වෙද්දී පියා ද අහිමි විය. හොඳ ශිෂ්‍යයෙකු ලෙස පිලිගැනුනු ඔහු 1938 දී ක්‍රැකොව්වල දර්ශනවාදය සහ සාහිත්‍යය උගෙන ගැනීම ආරම්භ කල අතර නාට්‍ය කලාව පිලිබඳව තියුනු උනන්දුවක් ඇති කර ගත්තේ ය. ජර්මානු ආක්‍රමන කාල පරිච්ඡේදය තුල දී ඔහුට ඉතා දුෂ්කර වූ රැකියා කටයුතුවල යෙදීමට බල කෙරින. මෙම කාලයේ දී ඔහු පූජක වරයට ඇතුල් වීමට තීරනය කලේ ය. 1942 දී ඔහු ක්‍රැකොව් අග රදගුරු වැයික්කියේ රහස් සෙමනේරියකට බැඳුනේ ය.

1946 නොවැම්බර් 1 දා ඔහු පූජක වරයට ඇතුල් කර ගන්නා ලදී. අනතුරුව එලඹි දෙවසර රෝමයේ ගත කල ඔහු එහි දී දේව ධර්මය සහ ශාන්ත ජෝන් කුරුසියේ පරම විඥානය පිලිබඳව ආචාර්ය උපාධියක් ලබා ගත්තේ ය. ඔහු පෝලන්තයේ දී සිය අධ්‍යයන කටයුතු දිගට ම කර ගෙන ගියේ ය. උපාධිය ලබා ගැනීමෙන් අනතුරුව ඔහු 1954 දී ලුබ්ලින් කතෝලික විශ්වවිද්‍යාලයේ ගුරු පත්වීමක් බාර ගත්තේ ය.

1958 සැප්තැම්බර් 28 දා රද ගුරු බවට පත් වූ ඔහු 1964 දී ක්‍රැකොව්හි අග රද ගුරු විය. මෙය වතිකානුවේ ජීවය සහ සම්පත් පිලිබඳ තීරනාත්මක වසරක් විය. එම වසරේ සිදු වූ දොලොස් වන පයස් පාප්ගේ මරනය මගින් ස්පාඤ්ඤයේ, ඉතාලියේ සහ ජර්මනියේ ෆැසිස්ට් තන්ත්‍රයන් සමග පාප්ගේ සහයෝගිකාරකම් හේතුවෙන් ද යුරෝපානු යුදෙව්වන් සමූල ඝාතනයට එරෙහි වීම වතිකානුව ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ද පල්ලිය අතිශයින් ම අපකීර්තියට පත් කල පාලනය අවසානයකට ගෙන ආවේ ය.

දොලොස් වන පයස්ට පසුව පැමිනියේ දේව මෙහෙය ස්වභාෂාවෙන් පැවැත්වීම සහ අනෙකුත් ලිබරල් ප්‍රතිසංස්කරන ඇතුලු කතෝලික පූජා විධිවල සහ ආගමික භාවිතයේ දුරදිග යන වෙනස්කම් සිදු කල 23 වන ජුවාම් පාප් (1958-1963) සහ හය වන පාවුලු (1963-1978) ය. කතෝලික ධර්මයේ ඇතුලත්ව තිබූ ප්‍රතිසෙමිටික්වාදයෙන් (ප්‍රතිසෙමිටික්වාදය යනු යුදෙව් විරෝධය යි) පල්ලිය මුදා ගැනීමට ද 23 වන ජුවාම් සහ 6 වන පාවුලු වග බලා ගත්තෝ ය.

ක්‍රැකොව් අග රද ගුරු තනතුර දරද්දී වොජ්ටිලා පෝලන්ත ස්ටැලින්වාදී පාලනය සමග ගැටුමකට පිලිපන්නේ ය. වොජ්ටිලා ඔවුන්ගේ දේශපාලනමය පාලනය ප්‍රශ්නයට ලක් නො කල අතර බල කර සිටියේ

කතෝලික පල්ලියට සිය දෘෂ්ටිවාදමය අනුභාවය තබා ගැනීමට අවකාශ දෙන ලෙස යි. මෙලෙස නෝවා හුටා නව කාර්මික නගරයේ පල්ලියක් ඉදි කිරීම තහවුරු කිරීමට ඔහුට හැකි විය. 1967 දී වොජ්ටිලා කාඩිනල් තනතුරට පත් කරනු ලැබී ය.

1978 ඔක්තෝබර් 16 දා වොජ්ටිලා පාප් ධුරයට තෝරා ගැනීම කිසි යම් හැඟීම් ආවේගයක් නිර්මානය කලේ ය. සාන්ත පීතර මුල් පුටුව වසරකට හෙබවූ ලන්දේසි ජාතික 6 වන ඒඩ්‍රියන්ගෙන් වසර 455කට පසුව ප්‍රථම වතාවට ඉතාලි ජාතිකයෙකු නොවන අයෙක් කතෝලික දේව සභා නායකත්වයේ මුල් තැන අරා සිටී. පදවිය අපේක්ෂා කල ඉතාලි ජාතිකයන් දෙදෙනා අතර තීරනයකට නොඑලඹි තරග වාර ගනනාවකට අනතුරුව අට වන ඡන්ද විමසීමේ දී කාඩිනල්වරු 111 දෙනාගෙන් 94 දෙනෙක් පෝලන්ත අපේක්ෂකයාට පක්ෂව ඡන්දය දුන්හ. වයස 58ක් වූ නව පාප්වරයා අසාමාන්‍ය ලෙස තරුන වයසේ වී ය.

මෙම තීන්දුවේ දේශපාලන අර්ථය පැහැදිලි ය. 1960 ගනන්වල අවසානයේ සිට බටහිර ලෝකයේ දියුනු ධනපති ජාතීන් ද නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදීන් විසින් පාලිත රටවල් ද ප්‍රචන්ඩ දේශපාලන ගැටුම්වලින් නැවත නැවතත් හෙල්ලුම් කමින් තිබුනි. වොජ්ටිලාට පෙර සිටි පාප්වරුන් වූ 23 වන ජුවාම් සහ 6 වන පාවුලු පල්ලියේ ධර්මය සහ අභ්‍යන්තර තන්ත්‍රය ප්‍රතිසංස්කරනය කිරීමෙන් සමාජ කැලඹීමට ප්‍රතිචාර දැක්වීමට උත්සාහ කලෝ ය.

1960 ගනන්වල මුල් අර්ධයේ දී දෙවන වතිකානු කවුන්සිලය පල්ලියේ සාම්ප්‍රදායික මතවාදයේ යම් ලිහිල් කිරීමක් සහ රද ගුරුන්ටත් ගිහි කතෝලිකයන්ටත් වඩා වැදගත් භූමිකාවක් ලබා දීම වැනි කාර්යයකට මග විවර කලේ ය. 23 වන ජුවාම් ද සෝවියට් සංගමය පිලිබඳව වඩා ලිහිල් පිලිවෙතක් හඳුන්වා දුන් අතර 6 වන පාවුලු මෙම පිලිවෙත දිගට ම ගෙන ගියේ ය. දෙදෙනා ම ස්ටැලින්වාදී පාලනයන් සමග වඩා සමීප සහයෝගිතාව තහවුරු කර ගැනීමට වෑයම් කලෝ ය.

1978 දී 6 වන පාවුලුගෙන් අනතුරුව පැමිනි පලමු වන ජුවාම් පාවුලු වූ ඇල්බිනෝ ලුසියානිට මෙම ගමන් මග දිගට ම ගැනීමට අවශ්‍ය විය. එහෙත් නිලයට පත්ව දින 33කින් පසුව අලුත් පාප්වරයා සිය යහනේ දී ම මිය ගොස් තිබුනි. මෘත ශරීරය කපා පරීක්ෂා කිරීමට අවසර දීම වතිකානුව ප්‍රතික්ෂේප කල හේතුවෙන් ඔහුගේ මරනය සිදු වූ ආකාරය කිසි ලෙසකින් වත් විස්තර විභාග නො කෙරිනි.

වොජ්ටිලා පල්ලියේ ඉහල ම නිලය අත් කර ගැනීම දෘෂ්ටිවාදමය හා දේශපාලනමය සන්ධිස්ථානයක් නියෝජනය කලේ ය. යුගයේ උද්වේගය වූ නවීකරනයට එරෙහි බලවේගයක් බවට පල්ලිය වඩාත් විවෘතව හැරවූ පල්ලියේ අලුත් ප්‍රධානියා ඉක්මනින් ම පෙර තත්වය යලි තහවුරු කරන්නා වූ පාප්වරයෙකු ලෙස සැලකීමට ලක් විය. ඔහු තමන් මත් පුද්ගලිකව කැප වුනු ශාන්තුවරුන්ගේ සහ කන්‍යා මරියගේ නිකායක් ඉහල නංවා, දලදඬු සමාජ සදාචාර නීති පෙරට දමා, රද ගුරු වැයික්කි මත රෝමයේ බලාධිකාරය ශක්තිමත් කර, විවේචනශීලී දේවධර්මාචාර්යවරු, ගනනාවක් දන්ඩනයට ලක් කලේ ය. දේශපාලනිකව, පෝලන්ත පාප්වරයෙකු පත් වීම ලියොනිඩ් බ්‍රෙෂ්නෙෆ් යටතේ වූ මොස්කව් නායකත්වයට අභියෝගයක් විය.

## පාප් සහ සොලිඩැරිටිය

පාප් තේරීමේ ඡන්දය පැවැත්වුන වකවානුවේ දී පෝලන්ත කම්කරු පන්තිය සහ ස්ටැලින්වාදී පාලනය අතර ගැටුම නාටකාකාරව උත්සන්න විය. 1956 ලේ වැකි මර්දනයකට ලක් වුන කම්කරු නැගිටීමේ සිට ම පෝලන්තය ගැටුම් මාලාවකින් දදුරු වී ගොස් තිබින. මිල ඉහල යාම්වලට එරෙහිව 1970 දී ඇති වූ වර්ජන රැල්ලක් නිසා පක්ෂයේ සහ ආන්ඩුවේ නායක ව්ලැඩිස්ලොව් ගොමුල්කාට ඉල්ලා අස් වීමට බල කෙරුනේ ය. ඔහුගේ අනුප්‍රාප්තිකයා වූ එඩ්වඩ් ජිරැක්ට ඉහල දැමුනු මිල ගනන් ඉවත් කර ගැනීමට සිදු විය.

1976 දී, වර්ජන, දැවැන්ත පෙලපාලි හා මාර්ග බාධක අරගල ඇති වීමට හේතුකාරක වෙමින් යලිත් වරක් බඩු මිල ඉහල දැමීමට ජිරැක් උත්සාහ දැරී ය. ඉක්බිති එලැඹි වසරවල දී කම්කරු ආරක්ෂාව සඳහා වන කමිටුව හා ස්වාධීන වෘත්තීය සමිතිවල ආරම්භක කමිටු පිහිටුවනු ලැබූ අතර 1980 දී -- මිල ඉහල නැංවීම්වලට එරෙහි අලුතෙන් ඇරඹි වර්ජන රැල්ලකින් පසුව -- මෙම සංවිධානයන් දශලක්ෂ ගනන් කම්කරුවන්ගේ අනුගාමිකත්වය දිනා ගත් වෘත්තීය සමිති සොලිඩැරිටිය බවට පත් වීමට ඒකාබද්ධ විය.

පෝලන්තයේ බලගතු කම්කරු ව්‍යාපාරයක් මතු වී ඒම නැගෙනහිර සහ බටහිර ආන්ඩු විශාල උත්සුකයකින් යුතුව විමසිල්ලට ලක් කලේ ය. පෝලන්ත ව්‍යාපාරය සෝවියට් සංගමයට සහ අනෙකුත් නැගෙනහිර යුරෝපා රටවලට පැතිර යාම ස්ටැලින්වාදී පාලනය තර්ජනයට ලක් කරනු ඇතිවා පමනක් නො ව බටහිර කම්කරුවන් ද අලුත් සටන්කාමී අරගලවලට ප්‍රබෝධමත් කරනු ද ඇති ය. 1970 ගනන් මැද දී එවන් අරගල රැල්ලක් සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ හා වෘත්තීය සමිති නිලධරයේ ඒකාබද්ධ ප්‍රයත්නයකින් මැඩ ලනු ලැබී ය.

සමාජ ප්‍රජාතන්ත්‍රවාදියෙකු වූ ජර්මානු චාන්සලර් හෙල්මුට් ශ්මිඩ්ට් ඒ වූ ආකාරයෙන් ම පෝලන්ත කම්කරුවන්ට එරෙහිව ජිරැක් ආන්ඩුවට අනවරතයේ සහයෝගය දුන්නේ ය. ශ්මිඩ්ට් ජිරැක් සමග පෞද්ගලික මිතුදමක් ද පවත්වා ගෙන ගියේ ය.

පෝලන්තයේ සහ නැගෙනහිර යුරෝපයේ ප්‍රචන්ඩ විප්ලවයක අනතුර පිලිබඳ දෙවන ජුවාම් පාවුලු හොඳින් සවිඥානක විය. පෝලන්ත කම්කරු පන්තිය ඇතුලත අධිරාජ්‍යවාදයට පක්ෂපාතී නායකත්වයට සහාය දෙමින් ස්ටැලින්වාදී පාලනය වමෙන් නො ව දකුනෙන් පෙරලා දැමීම සහතික කිරීමට ඔහු වග බලා ගත්තේ ය. මෙම ප්‍රයත්නයට ඔහු ආධාර ලැබුවේ සීඅයිඒයෙන් පමනක් නො ව සීඅයිඒය සහ ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව සමග පෙල ගැසුනු විවිධාකාර ඒඑෆ්එල්-සීඅයිඕ විදේශ ක්‍රියාන්විතයන්ගෙන් ද වී ය.

දෙවැනි ජුවාම් පාවුලු හා පල්ලිය ස්ටැලින්වාදයට දක්වූ වෛරය, ප්‍රජාතන්ත්‍රවාදයට දක්වූ කැපවීමක් ලෙස මාධ්‍ය විසින් හුවා දක්වන ලදී. මෙය අමූලික විකෘති කිරීමකි. වැඩවසම් බූදලයක් ලෙස පූජකයින්ගේ බලය හා ධනය රැක දීමට කතෝලික පල්ලිය වලිකෑම හේතු කොට ප්‍රොතෙස්තන්තවාදය පැන නැගීම දක්වා දිවයන, වසර 500කට අධික කාලයක් ප්‍රජාතන්ත්‍රවාදයේ දෘඪතරම විරුද්ධවාදියා වූ ආයතනයක මුල් පුටුව හොබවන්නා පාප් ය.

ස්ටැලින්වාදය කෙරේ වන පල්ලියේ ද්වේශය ඒ හැටියෙන්ම ගත් කල ස්ටැලින්වාදී නිලධරයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, කුල-ආකාර පාලනය නිසා ඇති වූවක් නො වේ. ඒ සියල්ල ආයතනයක් ලෙස පල්ලියේ ම අභ්‍යන්තර ක්‍රියාකාරකම් සමග මනාව ගැලපේ. පූර්ව ධනවාදී සමාජයේ උපත ලද දැන් ධනවාදී සමාජ සබඳතාවන්ගේ මුල් විහිදුවාගෙන සිටින පල්ලි මන්ඩලය මත් වංශයකි.

කෙසේ නමුත්, කතෝලික පල්ලිය ලොව විශාලතම තනි දේපල හිමිකරුවා ය. එබැවින්, ධනවාදී දේපල කරපින්නා ගත් ලේ වැකි ලතින් ඇමරිකානු ඒකාධිපතිත්වයන්ට සහාය දුන් පල්ලිය අනෙක් අතට, ජනසතු දේපල මත පදනම් වූ සෝවියට් සංගමයේ සහ නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී පාලනයන්ට විරුද්ධ විය.

මෙම අතිමූලිකව ප්‍රතිගාමී වූ පදනම මත කතෝලික පල්ලිය සොලිඩැරිටිය සමඟ විවෘතව ම සහයෝගී විය. පත්වීම ලබා අට මසක් ඉකුත්වීමටත් පෙර අලුත් පාප් පෝලන්තය වෙත ඔහුගේ ප්‍රථම ''වන්දනා චාරිකාව'' කල අතර 1983 හා 1987 දී තව දුරටත් අතිරේක සංචාරයන් ද කලේ ය. 1980 ජනවාරියේ දී දෙවැනි ජුවාම් පාවුලු ලෙච් වැලෙස්සා නායකත්වය දුන් සොලිඩැරිටි සාමාජික පිරිසකට තමන් හමුවීමට අවස්ථාවක් ලබා දුන්නේ ය. එලඹුන වසරවල දී වෘත්තිය සමිතියට සහයෝගය පිනිස විවිධාකාර මූලාශ්‍රයන්ගෙන් අඩු තරමේ ඩොලර් මිලියන 50 ක් වත් වතිකානුව එකතු කලේ ය. කෙසේ වෙතත් වතිකානුවේ එල්ලය වූයේ කම්කරුවන්ගේ සමාජමය ඉල්ලීම්වලට සහාය දැක්වීම නො වී ය. ඒ වෙනුවට, ඔවුන් මාන බැලුවේ ව්‍යාපාරය ප්‍රතිගාමී කතෝලික දෘෂ්ටියේ සහ පෝලන්ත ජාතිකවාදයේ අනුහාව තුල රඳවා ගැනීමට සහ එය පවත්නා පර්යායට කෙරෙන ජාත්‍යන්තර අභියෝගයක් බවට වර්ධනය නො වන බවට වග බලා ගැනීම ය. සහශ්‍ර එකහමාරක් විහිදී ගිය අධිකාරය හා පර්යාය රැකගැනීමේ අත්දැකීම් සහිත කතෝලික දේව සභාව පෝලන්තය තුල වර්ධනය වූවා වැනි වන ජනතා ව්‍යාපාරයක් අක්‍රිය ආකාරයට හීලෑ නො කල හැකි බව ද ක්‍රියාශීලිව බලපෑමට ලක් කර වෙනත් මාවතකට හැරවිය යුතු බව ද හොඳින් ම දැන සිටියේ ය.

පෝලන්ත ජාතික පාප් වරයකු පත් කිරීම මගින් ඒ වන විටත් පෝලන්තයේ කතෝලික දහම ස්ථාපිත කිරීම තහවුරු කර තිබිනි. වොජ්ටිලා කෙලවරක් නැතිව සිය පෝලන්ත සම්භවය ගැන කතා කල අතර පෝලන්ත ජාතිකවාදයට බොරු ප්‍රසංශා කරමින් පෝලන්තය '' කතෝලික ජාතිය '' ලෙස හැඳින්වී ය. 1979 ජුනියේ දි වෝර්සෝහි විජයග්‍රහනයේ චතුරස්‍රයේ දී ප්‍රීතියෙන් කුල්මත්ව සිටි පිරිසක් හමුවේ ''මනුෂ්‍යත්වයේ ද මිනිස්වර්ගයාගේ ද සංවර්ධනයට පෝලන්ත ජාතිය '' කල එකතු කිරීම වගවර්නනා කල ඔහු එය වටහා ගත හැක්කේ ද අගය කල හැක්කේ ද ක්‍රිස්තුන් තුලින් පමනක් බව පැවසීය. '' යුරෝපා සිතියමෙහි ස්වාධීන පෝලන්තය නොමැතිව යුක්තිසහගත වූ යුරෝපයක් තිබිය නොහැකිය.'' යන වාක්‍යයේ ඔහුගේ දේශනය උච්චස්ථානයට පැමිනියේ ය.

පෝලන්තය තුල පාප් ගේ මැදිහත් වීම නොවන්නට සිදු වීම් මාලාව පෝලන්ත කම්කරුවන්ගේ මහා විරැකියාවට හා කටුක දරිද්‍රතාවට අවසන යොමු වූ ව්‍යසනකාරී මාවතකට හැරීම සිදු නොවනු හැකිව තිබුනි. ආරම්භයේ දී සොලිඩැරිටි ව්‍යාපාරය තුල පැවතුනේ කතෝලික ප්‍රවනතා පමනක් නො වේ. ශක්තිමත් අනාගමික හා සමාජවාදී ස්වරූපයේ ප්‍රවනතා ද එහි වීය. කෙසේ වෙතත් මේවාට ස්ටැලින්වාදී පාලනයට එරෙහි වීමේ සඵලදායක ඉදිරිදර්ශනයක් නො තිබුනි.

ආධානග්‍රාහී කතෝලිකත්වයේ විශාල මාත්‍රාවක් සමග, ලෙනින් නැව් තටාකාංගනයේ සටන්කාමී කම්කරු නායකයකු ලෙස වූ සිය කීර්තිය ඒකාබද්ධ කල මිනිසෙකු වූ ලෙච් වැලෙස්සා වටා වූ කතෝලික ජාතිකවාදී පිලේ පාලනය යටතට ව්‍යාපාරය ගෙන ඒමේ දී වතිකානුව සැලකිය යුතු ලෙස දායක විය. වැලෙස්සාමත් පාප්ගේ භූමිකාව විවෘතවම පිලිගත්තේ ය. 1989 දී ඔහු මෙසේ ප්‍රකාශ කලේ යඃ ''සොලිඩර්නොස්ක් වෘත්තීය සමිතියේ සහ මගේ පැවැත්ම මෙම දෙවන ජුවාම් පාවුලු ශ්‍රේෂ්ඨ පෝලන්තුවානුවා සහ ශ්‍රේෂ්ඨ මිනිසාගේ ප්‍රතිරූපය නොවන්නට සිතන්නට වත් නොපුලුවන.''

සොලිඩැරිටියට දේශපාලන හා මූල්‍ය සහයෝගය දෙන අතරේ ම එම තන්ත්‍රය සමග විවෘත ගැටුමකට යාමෙන් වැලකීමට ද පාප් උත්සාහ කලේ ය. ඔහු නැවත නැවතත් මධ්‍යස්ථභාවය හා ඉවසීම ඉල්ලා සිටියේ ය. ආන්ඩුව සමග ගට්ටන වඩාත් ප්‍රචන්ඩ වත් ම සොලිඩැරිටිය කම්කරුවන්ව හීලෑ කිරීමටත් පාලනය කිරීමටත් වැඩි වැඩියෙන් මැදිහත් විය.

සොලිඩැරිටිය බලය ගැනීමට පෙරට නොයන බවට වැලෙස්සා නිරන්තරයේ අවධාරනය කලේ යඃ ''අපට ආන්ඩු කිරීමට අවශ්‍ය නැත. ඒ වෙනුවට අපව පිලිගැනීමක් අපි ආන්ඩුවෙන් බලාපොරොත්තු වෙමු. ඔවුන් පාලනය කරන විට එය නිවැරදිව කරන බව ස්ථිර කර ගැනීමට ඔවුන් පිලිබඳව සොයා බැලීමට අපට අවශ්‍යයි.'' 1981 දෙසැම්බරයේ දී යුද නීතිය ප්‍රකාශයට පත් කර දහස් ගනන් කම්කරුවන් සහ සොලිඩැරිටි නායකයන් අත් අඩංගුවට ගත් වොශෙයික් ජෙරුසල්ස්කි පසු කලෙක දී පාප් විසින් පෙන්නුම් කරන ලද හික්මීම විවෘතව අගය කලේ ය. පාප්ගේ මරනය පිලිබඳව වූ රූපවාහිනී සම්මුඛ සාකච්චාවක දී ඔහු මෙසේ කීයඃ ''එම අවස්ථාවේ දී සමාජමය හැඟීම් ඇවිස්සීමෙන් ඔහු වැලකී සිටියේ ය.'' පසු කලෙක, ස්ටැලින්වාදී පාලනය ඇද වැටීමෙන් පසුව සොලිඩැරිටි නායකයන් බලයට පැමින ධනවාදය පුනස්ථාපනය අධීක්ෂන කිරීමේ දී ඔවුන් කම්කරු පන්තිය ඉදිරියේ අපකීර්තියට පත් වීමේ වේගය පිලිබඳව පාප් වැඩි වැඩියෙන් කනස්සලු වූ බවක් පෙනෙන්නට තිබුනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කතෝලික පල්ලියේ අනුභාවයට පහර වදිතැයි ද නව පර්යාය අනතුරට පත් වේ යැයි ද කියා යම් යුක්ති සහගත බවකින් යුතුව පාප් බිය පත් විය.

1991 හා 1993 කරන ලද සංචාරවල දී ඔහු සරලව බටහිර ධනවාදය කොපි කිරීමට විරුද්ධව අනතුරු ඇඟවී ය. 2003 දී පෝලන්තයට කල අවසන් චාරිකාවේ දී ඔහු මීටද වඩා දලදඬු ලෙස කතා කලේ ය. යමෙකු නිදහස සඳහා ගෙවන ලද මිල අමතක කල විට ඔහු ''අරාජකවාදයෙන්'' වැඩි ඈතක නොසිටී යයි ඔහු පැවසී ය. ඔහු සොලිඩැරිටි ව්‍යාපාරයට දේශපාලනයෙන් ඉවත් වී සිටින ලෙස දේසනා කල අතර පෝලන්තයේ ඇස් නිලංකාර කරවන අයුක්තීන් දෙසට ඇඟිල්ල දිගු කලේ ය. වැටුප් ගෙවා නැත, කුඩා ව්‍යාපාර අතුගෑවී ගොසිනි, කම්කරුවන්ට නිවාඩු හෝ පවුලේ උදවිය සමග ගතකිරීමට කාලයක් හෝ නොමැත.

## දෙවැනි ජුවාම් පාවුලු හා සෝවියට් සංගමය පිලිබඳ ඇමරිකානු පිලිවෙත

පෝලන්ත ජාතික පාප්වරයෙකු නම් කිරීමේ කතෝලික පල්ලියේ තීරනය සෝවියට් සංගමය සම්බන්ධයෙන් ඇමරිකානු විදේශපිලිවෙතේ වෙනස් වූ මාවත සමග සමීපව සම්බන්ධිත ය. ජනාධිපති ජිමී කාටර් යටතේ ද වඩාත්ම විවෘතව ඔහුගේ අනුප්‍රාප්තික රොනල්ඩ් රේගන් යටතේ ද සංහිඳියාව වෙනුවට එදිරිවාදිකම කල එලි බටුයේ ය.

වොජ්ටිලා ඒ වන විටත් ක්‍රැකොව් අග රද ගුරු ලෙස හිඳිමින් කාටර් පරිපාලන සමයේ ජාතික ආරක්ෂක උපදේශක ලෙස පත්ව සිටි පෝලන්තයේ උපන් ස්බිග්නිව් බ්රෙසෙන්ස්කි සමග දිගින් දිගට ම ලිපි හුවමාරුවක යෙදී සිටියේ ය. වොජ්ටිලාගේ පූර්වගාමියාගේ අවමංගලෝත්සවයට නිල ඇමරිකානු නියෝජිතයා ලෙස සහභාගි වූ බ්රෙසෙන්ස්කි, පල්ලියේ නායකත්වයට වොජ්ටිලා පත් කෙරුනු 1978 හි පාප් මැතිවරනයේ සමස්ත කාල පරිච්ඡේදය තුල රෝමයේ නැවතී සිටියේ ය.

ජනාධිපති රේගන් යටතේ මෙම සහයෝගිතාව උත්සන්න විය. එවකට වතිකානුවේ ඇමරිකානු තානාපති වූ ජේම්ස් නිකල්සන් සෝවියට් සංගමයට එරෙහිව, වොෂින්ටනය සහ වතිකානුව අතර ''මූලෝපායාත්මක සන්ධානයක්'' පිලිබඳව කතා කරයි. වතිකානුවේ රහස් හා රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියා පිලිබඳව පොතක් ලියූ කාල් බර්න්ස්ටයින් සහ මාකෝ පොලිටි යන ලේඛකයන් රැස්කල තොරතුරුවලට අනුව 1981 සිට ම සීඅයිඒ අධ්‍යක්ෂ විලියම් කේසි සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ වර්නන් වෝල්ටර්ස් පාප් සමග නිරන්තර රහස් සාකච්ඡා පවත්වා ඇත. ප්‍රධාන මාතෘකාව වූයේ සොලිඩැරිටියට සීඅයිඒ මූල්‍ය හා ද්‍රව්‍යමය ආධාර සැපයීම ය.

මොස්කෝවේ පාලක නිලධරය තීව්‍ර වූ බාහිර පීඩනයේ සහ වැඩෙන අභ්‍යන්තර සමාජ පීඩනයේ එකතුවට ප්‍රතික්‍රියා කලේ ධනවාදය පුනස්ථාපනය කිරීමේ පිලිවෙත දියත් කරමිනි. කෙතරම් උත්ප්‍රාසාත්මක ලෙස පෙනීගියත්, සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයට මිඛයිල් ගොර්බෂොෆ්ගේ නැගීමේ මූලයන් පවතින්නේ වොජ්ටිලා රෝමයේ ශුද්ධවූ ආසනයට ගෙන ආ එකම විශයබද්ධ වෙනස්වීම් තුල ය. පෝලන්තයේ සිදුවීම් ක්‍රෙම්ලින් නිලධරය ගැඹුරින්ම දෙදරවී ය. අවසානයේ දී, ධනවාදී දේපල හඳුන්වා දීම හරහා තමන්ගේ පාලනයට නව පදනම් නිර්මානය කර ගනිමින් සෝවියට් සංගමයේ විය හැකි එවැනි වර්ධනයන් වලක්වා ලීමට ඔවුහු මාන බැලුවෝ ය. ගොර්බෂොෆ්ගේ පෙරෙස්ත්‍රොයිකාවේ අත්‍යවශ්‍ය වූ වැදගත්කම මෙය ය.

1989 දෙසැම්බරයේ දී වතිකානුවේ සාකච්ඡාවකට අවස්ථාව ලද පලමු සහ එකම සෝවියට් සංගමයේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා බවට ගොර්බෂොෆ් පත්විය. වසර තුනකින් අනතුරුව ගොර්බෂොෆ් මෙම වචනවලින් පාප්ගේ භූමිකාව වග වර්නනා කලේ යඃ ''නැගෙනහිර යුරෝපයේ මෙම

වසරවල සිදු වූ සෑම දෙයක්ම, මේ පාප් නොසිටින්නට සිදු වීමට ඉඩ නොතිබිනි. ''

## පාප් සහ දකුනු ඇමරිකාව

දෙවන ජුවාම් පාවුලු පෝලන්තයේ සහ නැගෙනහිර යුරෝපයේ ඔහුගේ මැදිහත් වීම් ''නිදහස'' හා ''ස්වාධීනත්වය''නම් වස්ත්‍රවලින් ඔතා ආවරනය කල ද ඔහුගේ දේශපාලන දිශානතියේ ප්‍රතිගාමී සාරය දකුනු ඇමරිකාවේ දී විවෘතව ම එලි දක්විනි. එහිදී ඔහු පාලක ප්‍රභුවේ පාර්ශ්වය ගත් අතර දක්ෂිනාංශික මිලිටරි ඒකාධිපතිත්වයන්ට එරෙහිව පීඩිතයන්ගේ අරගල සමග එක්ව සිටි ඊනියා ''නිදහස්කාමී දේවධර්මවාදීන්'' හික්මවී ය.

1983 දී නිකරගුවාවට කල ඔහුගේ මුල්ම චාරිකාවේ දී දෙවැනි ජුවාම් පාවුලු තවත් පූජකයන් දෙදෙනකු සමග සැන්ඩිනිස්ටා ආන්ඩුවේ ඇමති තනතුරු දරූ අර්නෙස්ටෝ කාඩිනල් පූජකයාට ප්‍රසිද්ධියේ තරවටු කලේ ය. 1995 දී නිකරගුවාවට කල වෙනත් චාරිකාවකදී, ''ඉග්ලේෂියා පොපියුලර්'' (ජනතාවගේ පල්ලිය) සහ ''විප්ලවවාදී භාවිතයේ නිරතව සිටින ක්‍රිස්තියානියේ '' නොමග ගිය ක්‍රිස්තියානි සමගිය යයි ඔහු හැඳින්වූ දෙය ද පාප් හෙලා දුක්කේ ය. ඒ හා සමග ම ඔහු, දක්ෂිනාංශික අග රද ගුරු සහ සැන්ඩිනිස්ටාවරුන්ගේ කටුක විරුද්ධවාදියා වූ මිගෙල් ඔබන්ඩෝයෝ බ්‍රාවෝ කාඩිනල් තනතුරට ඉහල දැම්මේ ය.

දෙවැනි ජුවාම් පාවුලු විසින් නිදහස්කාමී දේවධර්මාචාර්යවරු ගනනාවක් නෙරපා හැරිය අතර ඔවුන්ගේ තනතුරුවලට පැරනි මතධාරී රද ගුරුවරු හා පූජකවරු පත් කරන ලදී. ල මොන්ඩේ ඩිප්ලොමැටිකේ ට ලියන ෆ්‍රන්සුවා හුටෙයා: ''ස්වාධීනත්වය සහ දුගීන්ගේ උවමනාවන් ඊක දීම මත පදනම්ව දකුනු ඇමරිකාවේ මතුවී තිබුන පහල මට්ටමේ පල්ලි කන්ඩායම් හුදෙකලා කෙරුනු අතර විනාශකර පවා දැමුනි. ඔවුන්ගේ පැත්ත ගත් පූජකයන් ඉවත් කර දමා පූජා පහසුකම් අත් හිටවනු ලැබූ අතර තැන තැන එම නම් යටතේ ම අලුත් කන්ඩායම් ඇති කරනු ලැබී ය....''

ඒ හා සමග ම දක්ෂිනාංශික ඒකාධිපතියන්ගේ සහචරයෝ පල්ලියේ ඉහල ම තිලතලවලට නැංගෝ ය. ආජන්ටිනා මිලිටරි ඒකාධිපතියාගේ පාප් දූතයා වූ පියෝ ලාගි සහ චිලී මිලිටරි ඒකාධිපතියාගේ පාප් දූත ඇන්ජලෝ සොඩානෝ යන දෙදෙනාම දැන් කාඩිනල් වරු ය.

චිලියේ පිනෝචේගේ අත්තනෝමතික මිනීමරු පාලනය සොඩානෝ මේ වචනවලින් ප්‍රසංශාවට ලක් කලේ ය: ''විශිෂ්ඨ නිර්මානවල ද සුලු වැරදි තිබිය හැක. චිත්‍රයක වැරදි ගැන කාලය මිඩංගු නො කර එහි පොදුවේ පවතින ආශ්චර්යය කෙරේ සිත යොමු කරන ලෙස මම ඔබට අවවාද කල යුතු වෙමි.'' 1998 දී පිනෝචේ ලන්ඩනයේ සිටිය දී ඔහුව අත් අඩංගුවට ගැනීමට වරෙන්තුවක් නිකුත් කල විට පාප් ම චිලී ෆැසිස්ට් ජෙනරාල්වරයාට ප්‍රසිද්ධියේ සහාය දුන්නේ ය.

සෙමිටික් (යුදෙව්-අරාබි) විරෝධියෙකු ලෙස ප්‍රසිද්ධියේ පෙනී සිටි 9 වන පයස් පාප්, නාසි සහ මුසෝලිනි පාලන සමග සහයෝගීව විසූ 12 වන පයස් පාප් සහ දෙවන ලෝක යුද සමයේ ක්‍රොඒෂියාවේ ෆැසිස්ට් පාලනය හා සමීපව සිටි කාඩිනල් ස්ටෝනියක් පරම සුබොත්පාදනය (ශාන්තුවරු බව ප්‍රකාශ කිරීම), දෙවන ජුවාම් පාවුලුගේ දක්ෂිනාංශික ඒත්තු ගැන්වීම් තව දුරටත් පෙන්නුම් කරන ප්‍රකාශනයන් ය.

## පල්ලියේ පැරනි මතධාරී (කොන්සර්වේටිව්) ප්‍රතිපත්ති

දෙවන ජුවාම් පාවුලු ඔහුගේ පල්ලි පිලිවෙත්වල දී, කතෝලික පල්ලියේ ආන්තිකව කොන්සර්වේටිව් වූ ධර්මයේ ස්ථාවරයෙන් පවා ප්‍රතිගාමියෙකි. 1960 ගනන්වල දී දෙවන වතිකානු කවුන්සිලය ආරම්භ කල ප්‍රතිසංස්කරනවල ජීවය, සම්පූර්නයෙන් ම නොවුනද, ආපස්සට හැරවීමට ඔහු ක්‍රියා කලේ ය.

ප්‍රථමයෙන් ම කන්‍යාමරියා සුරුවම සහ සාන්තුවරු පිලිබඳව ඔහුගේ ලබ්ධිය ය. පසු ගිය වසර 400 දී ඔහුගේ පූර්වගාමීන් නිර්මානය කල නිර්දිෂ්ඨිත ශාන්තුවරුන් මෙන් දෙගුනයක් තරම් ශාන්තුවරු නිර්මානය කරමින්, පරම සුබෝත්පාදන 473ක් ඉටු කෙරිනි.

ලිංගිකමය සිරිත්විරිත්වලට අනපනත් පටවන වාග් කෝෂමය ''ඉවැන්ජලියට් වයිටේ'' (ක්‍රිස්තියානි ජීවදත්ත), ගබ්සාව පමනක් නොව කවරාකාර හෝ වන පවුල් සංවිධාන ක්‍රමයක් වුවද පිලිකෙව් කරයි. වර්ගයා බෝ කිරීමට අදහස් නොකරන කවර හෝ ලිංගික ක්‍රියාවක් දුරාචාරයක් ලෙස සලකයි. කොන්ඩොමය පවා හෙලා දකින අතර මෙය සියල්ලටමත් වඩා අප්‍රිකාවේ සහ ලෝකයේ බොහෝ ප්‍රදේශවල වන විනාශකාරී ඒඩ්ස් වසංගතය ගැන සැලකීමේදී සමාජමය වශයෙන් විනාශකාරී වූද අමනුස්ස වූද ප්‍රතිපත්තියකි. ජර්මනියේ දී, බිෂොප්වරුන්ගේ සහ අනෙක් පල්ලි සාමාජිකයන්ගේ දැඩි විරෝධයට එරෙහිව යමින් නීත්‍යානුකූල ගබ්සාව සඳහා වන රටේ සැකැස්මේ කොටසක් ලෙස ගැබිනි කාන්තාවන්ට උපදෙස් දෙන කමිටුවලින් පල්ලිය ඉවත් විය යුතු යැයි පාප් බලකර කියා සිටියේ ය.

පාප්ගේ පැරනි මතධාරී (කොන්සර්වැටිව්) පුද්ගලික පිලිවෙත් ද නැවත නැවතත් ගැටුම් ඇති කලේ ය. ඩයෝසීස ගනනාවකට පැරනි මතධාරී බිෂොප්වරුන්

උඩින් පත් කිරීම මගින් ඔහු මතභේදයන් ඇවිලවී ය. උදා., ශර් - වුල්ෆැන්ග් හැස්, කොලෝන් - ජොඇෂිම් මෙයිස්නර්, වියානා - හාන්ස් හර්මන් ග්‍රෝඅර් සහ ශාන්ත පෝල්ටන් - කර්ට් ක්‍රෙන්. ලියොනාඩෝ බොෆ්, ඉයුජින් බෘවර්මැන්, හාන්ස් කුං සහ තිස්ස බාලසූරිය වැනි විවේචනශීලී දේවධර්මාචාර්යවරුන්ගේ කෘති ප්‍රසිද්ධ කිරීම තහනම් කරමින් හා ඔවුන් ඉගැන්වීම්වල නිරත වීම වලක්වා ලමින් තහංචිවලින් ඔවුන්ගේ කටවල් අගුල් දමන ලදී.

1980 දී පාප් ගැන විවේචනශීලී වූ ලිපියක් පලවීමෙන් පසු පල්ලියේ ඉගැන්වීම තහනම් කරන ලද ස්විස්ටර්ලන්ත දේවධර්මාචාර්ය හාන්ස් කුං පල්ලියේ අභ්‍යන්තර වාතාවරනය සහ දෙවන ජුවාම් පාවුලුගේ භූමිකාව මෙසේ විස්තර කරයිඃ ''(පාප්) පුම්බා ඇති ශාන්තුවරු සංඛ්‍යාවක් පිටුපසින් සිටින අධිකාරය වන අතරතුරේදී ම, ඒකාධිකාරී බලතල ඇතිව ඔහු හිතවාදී නොවන දේවධර්මාචාර්යවරු, පූජකයන්, භික්ෂූන් හා දේවගැතිවරුන්ට එරෙහිව උසිගන්වයිඃ, සියල්ලටමත් වඩා විචාරශීලී චින්තනයෙන් සහ උද්යෝගී ප්‍රතිසංස්කරනවලින් විශිෂ්ඨත්වයට පත් භක්තිවන්තයන් මිථ්‍යාදෘෂ්ටිකයන් මැඩලන මෝස්තරයට දඩයම් කරයි. 12වන පයස් ඔහුගේ කාලයේ ඉතාම වැදගත් දේවධර්මාචාර්යවරු දඩයම් කල ආකාරයට ම (ශේනු, කොඟාර්, ද ලුබක්, රානර්, තේල්හාඩ් සහ ශාර්ඩින්) දෙවන ජුවාම් පාවුලු (සහ ඔහුගේ මහා පරීක්ෂක රැට්සින්ගර්) ශීලබික්ස්, බාලසූරිය, බොෆ්, බූලානියි, කරන් මෙන්ම රද ගුරු ගයිලෝ (එව්රෝ) සහ අග රද ගුරු හන්තුසන් (සියටල්) දඩයම් කරයි. ප්‍රතිඵලය වී ඇත්තේඃ අවමානයට ලක් වීම, භීතිය සහ නිදහස අහිමිවීම හාත්පස පැතුරුන ඔත්තු බැලීමේ පල්ලියකි. රද ගුරුවරු තමන් පල්ලියට එන බැතිමතුන්ගේ සේවකයන්සේ සිතනවා වෙනුවට තමන් රෝමානු ආන්ඩුකාරයන් යයි සිතා සිටිති. දේවධර්මාචාර්යවරු එක්කෝ යටහත්පහත් ලෙස ලියති නැතහොත් කිසිවක් නොලියති.''

විවේචනාත්මක හඬවල් නිශ්ශබ්ද කැරෙද්දී මූලධර්මවාදී වූ ද දැඩි සේ ධුරාවලිගත වූ ද ඕපුස් ඩී නිකායට පල්ලි දේවසභාව තුල සිය අනුභාවය ව්‍යාප්ත කර ගැනීමට හැකි වී තිබේ. එහි සාමාජිකයන් ගනනාවක් රද ගුරුවරු හා කාඩිනල්වරු ලෙස පත් කර තිබේ. මෙම නිකාය දැන් කියුරියා නම් කතෝලික පල්ලියේ මධ්‍යම පරිපාලනයේ සැලකිය යුතු අනුභාවයක් උසුලන අතර ඊලඟ පාප් තේරීමේ දී අති විශාල භූමිකාවක් ඉටු කිරීමේ හැකියාව සතු ය.

ඕපුස් ඩී නිකාය 1928 දී මැඩ්රිඩ් හි දී ජෙසුයිට්වර ජොසෙමරියා එස්ක්‍රිවා විසින් පිහිටවනු ලැබී ය. ලොව පුරා 80,000ක සාමාජිකයන් සහිත මෙම නිකාය සාපේක්ෂකව කුඩා ය. ෆැසිස්ට් ස්පාඤ්ඤයේ ඇමතිකම් 10ක් පමන ඕපුස් ඩී නියෝජිතයන් දරා සිටි ෆ්‍රැන්කෝ යුගය තුල මෙය ඉහලින් වැජඹුනි.

මරනයේ හුදු 27 වසරක් පමනක් ගත වෙද්දී දෙවන ජුවාම් පාවුලු විසින් පරම සුබොත්පාදනය කරන ලද එස්ක්‍රිවා වරක් හිට්ලර්ව විස්තර කලේ ''ස්පාඤ්ඤ පල්ලියේ ගැලවුම්කරුවා'' ලෙසට ය. මෙම නිකාය රහස් සමාජයක් මාදිලියට සංවිධාන ගතව පවතින අතර නිහඬතාවයේ දිවුරුමක සිට නිරන්තර යාඥාව සහ පටියකින් ද සබුක්කුවකින්ද යුත් ස්වයං දන්ඩනයක් දක්වා වන ඔවුන්ගේ ම හැසිරීම් ආඥාපද්ධතියක් ද තිබේ. මෙය පුරුෂෝත්තම හා නායකත්ව ලබ්ධියක් ප්‍රචාරනය කරන අතර ගැහැනුන් ''පහත් බවට'' අර්ථ ගන්වා ඔවුන්ගෙන් යටහත් පහත් බව හා දැඩි කීකරුකම ඉල්ලා සිටී.

ඔහුගේ පුරෝගාමීන්ට ප්‍රතිරූපීව දෙවන ජුවාම් පාවුලු අනෙකුත් ආගම් සම්බන්ධයෙන් විවෘත පිලිවෙතක් ගෙන ගියේ ය. ඔහු ප්‍රොතෙස්තන්ත පල්ලියක් (1983), යුදෙව් සිද්ධස්ථානයක් (1986) හා මුස්ලිම් දේවස්ථානයක් (2001) වෙත චාරිකා කල පලමු පාප්වරයා ය. 2000දී පාප් ඊස්රායෙලයේ සමූලඝාතන ස්මාරකය වෙත සංචාරය කර පල්ලියේ ඉතිහාස ගමන්මගේ දී ක්‍රිස්තියානින් විසින් සිදු කරන ලද පාපයන්ට සමාව ඉල්ලා සිටියේ සමූලඝාතනය ගැන 12වන පයස් පාප්ගේ නිහඬතාවය ප්‍රතික්ෂේප නොකරමිනි.

අර්බුද ග්‍රස්ත ධනේශ්වර සමාජයේ බලකනුවක් ලෙස ආගම ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවෙන් පලමුව පැන නැංගාවූ, ශාන්තියේ මෙම පිටස්තර ප්‍රදර්ශන යටින්, දෙවන ජුවාම් පාවුලු, ඔහුගේ ඉගැන්වීම්වල දී ප්‍රදර්ශනය කල, දර දඬු බව සමග නිරුවත් ප්‍රතිපක්ෂයක්ව කැපී පෙනේ. හුදු දෙවසරකට පෙර පාප් අනෙකුත් ක්‍රිස්තියානි සභා සමග එක්ව සත්ප්‍රසාද ලැබීම තහනම් කරමින් ආඥාවක් නිකුත් කල අතර පාප්ගේ අනුග්‍රහය ලද ''ඩොමිනස් ජේසුස්'' (ජේසු උතුමිය) ප්‍රකාශය අනෙකුත් ආගම්වල විද්‍යාමාන දෝශ පිලිබඳව එම ආගම් විවේචනය කරන අතරවාරයේ ම රෙපරමාදු පල්ලිය පල්ලියක් බව ප්‍රතික්ෂේප කරයි.

## පල්ලියේ අර්බුදය

ඔහුගේ දක්ෂිනාංශික දෘෂ්ටිය තිබියදී ම, පල්ලියට ස්ථාපිත පර්යායේ අතකොලුවක් ලෙස සිය ක්‍රියාකාරකම් ඉටුකර ගත හැකි වනුයේ පල්ලිය පීඩිතයන්ගේ ආරක්ෂකයකු සේ පෙන්නාගෙන සිටියහොත් පමනය යන්න ගැන දෙවන ජුවාම් පාවුලු සැමවිටම ගැඹුරින් ම දැනුවත්ව සිටියේ ය. ඔහු කතෝලික ධර්මතාවය ගැන ලේඛන ගනනාවක් ලියූ අතර ඒවායින් ඔහු ධනවාදයේ අධික්‍රියා සහ සමාජ පාපයන් හෙලා දුටුවේ ය. කියුබාවට කල සංචාරයකදී ඔහු නව-ලිබරල්වාදය සහ එහි විපාකයන් තියුනු ලෙස විවේචනය කලේ ය.

මෙම විවේචන කිසිදු අයුරකින් ධනවාදී පර්යායට එරෙහිව එල්ල නොකලේ ය. 19 වන ශතවර්ෂයේ අග භාගයේ දී කම්කරු පන්තියේ සැලකිය යුතු බලවේගයක් ලෙස සමාජවාදය මුලින්ම එලිබට තැන් සිට ම කතෝලික පල්ලිය සමාජවාදී විප්ලවය හෙලා දකින අතරම ධනවාදය ගැන සීමිත විවේචන කරන සහ කම්කරුවන්ගේ හා දුගීන්ගේ දුක්ඛිත තත්වය පිලිබඳව සංවේගයෙන් කතාකරන සමාජ ධර්මයක් ප්‍රකාශයට පත් කිරීම මගින් සමාජවාදයේ අනුභාවය සමග සටන් කිරීමට වැයම් කලේ ය. එලෙස ඔහු කෝෂ ග්‍රන්ථමය ''සෙන්ටසිමස් අනස්'' තුලින් සමාජවාදය අනාගමික ධර්මයක් ලෙස මූලධර්මාත්මකව ප්‍රතික්ෂේප කලේ ය.

පලමු හා දෙවන ඉරාක යුද්ධයට එරෙහිව පාප් විසින් ගනු ලැබූ පැහැදිලි ස්ථාවරය දකිය යුත්තේ මෙම සබඳතාවයන් තුල ය. ඔවුන්ගේ අවුරුදු 1500ක් පැරනි සම්ප්‍රදාය සහිතව කතෝලික දේව සභාව කෙටිකාලීනව සැලසුම්ගතව සිටින ධනේශ්වර දේශපාලනඥයන්ට වඩා දීර්ඝ වූ කාල පරාසයක් ගැන සිතයි. මැද පෙරදිග ඇමරිකානු කුරිරු ක්‍රියාකාරකම්, කතෝලික පල්ලියද ඇතුලු සමස්ත ධනවාදී ලෝක පර්යායම දිගුකාලීනව අස්ථාවර කිරීමෙන් වන තර්ජනය ගැන වතිකානුව දැනුවත්ව සිටී.

දෙවන ඉරාක යුද්ධය පුපුරායාමට මදකට පෙර, පාප්, ක්‍රිස්තියානුවකු වන ඉරාක උප අගමැති තරික් අසීස් හමුවී, යුද්ධය වැලැක්වීම සඳහා වොෂින්ටනයට හා බැග්ඩෑඩයට තානාපතිවරු යැව්වේ ය. ඔහු මෙම වචනවලින් යුද්ධය හෙලා දුක්කේ යː ''ශක්තිවන්තයා දුර්වලයාට එරෙහිව කරන යුද්ධය මීට පෙර කවරදාටත් වඩා පෝසතුන් හා දුප්පතුන් අතර ගැඹුරු බෙදීම එලිදරව් කලේ ය.''

ඔහුගේ දෘෂ්ටිවාදයට හා දේශපාලනයට මුලුමනින් පරස්පරවූ පාප්ගේ සාමය හා සමාජ සුසංවාදය පිලිබඳ වාචාල කථාවන්, 100කට වඩා වූ ඔහුගේ විදේශ සංචාර හා එක්ව (මේවා කලේ ඒවායේ ප්‍රචාරාත්මක වටිනාකම පිලිබඳව විශාල පරිස්සමකින් යුතුව ය.) ඔහුගේ යුගය තුල දී කතෝලිකයන් සංඛ්‍යාව ඉහල යාමට හේතුකාරක වී ය. කතෝලික පල්ලියේ සාමාජික සංඛ්‍යාව දැන් බිලියනයකට අධික වන අතර ඉන් අඩක් ජීවත්වන්නේ උතුරු හා දකුනු ඇමරිකාවේ ය.

කෙසේවෙතත් මෙම සංඛ්‍යාවන්ට පල්ලිය එරී ඇති දැවැන්ත අර්බුදය වසං කල නොහැක. පල්ලියේ සාමාජික සංඛ්‍යාවේ වර්ධනය ජනගහනයේ සමස්ථ වර්ධනය හා එක්ව ගමන්කර නැත. ජනගහනයේ අනුපාතයට පල්ලියේ සාමාජිකත්වය වර්ධනය වනුයේ අප්‍රිකාව සහ ආසියාවේ කොටස් ඇතුලත් කතෝලිකයන් කුඩා සුලුතරයක් වන ප්‍රදේශවල ය. අනුපාතාත්මකව එය ලතින් ඇමරිකාවේ එකතැන පල්වන අතර යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ පහල බසී. ලතින් ඇමරිකාව තුල කතෝලික පල්ලිය විවිධාකාර ඉවැන්ජලික ප්‍රොතෙස්තන්ත කන්ඩායම් අතින් පරාජය ලබන බව පලල්ව පෙනී යයි.

දෙවන ජුවාම් පාවුලු සැබැවින්ම මෙන් මුනිවරයෙකු බවට පත් කිරීමේ මාධ්‍ය වැයම් නොතකා ම පුලුල් මහජනයා කෙරේ වූ පල්ලියේ ග්‍රහනය එක දිගට පහල වැටෙමින් පවත්නා අතර තමන් කතෝලිකයන් බවට පිලිගන්නා අය අතර පවා කතෝලික පූජකයන් නරක ලෙස අපකීර්තියට පත් වෙමින් සිටී. ක්‍රියාශීලී හා කැපවුනු භක්තිමතුන් අහිමි වීම රටවල් ගනනාවක පල්ලිය මූල්‍ය අර්බුදයන්ට මුහුන දීමෙන් පිලිබිඹු වෙයි. ඇමරිකාවේ ඩෙට්‍රොයිට් ඇතුලු ප්‍රධාන නගරවල කතෝලික පාසල් වසා දැමෙමින් තිබේ.

පූජකවරු හා පල්ලියේ නිලධාරීන් සම්බන්ධ මෑතක දී සිදුවුන ලිංගික අපචාර සෝලි මෙම අර්බුදය තීව්‍ර කර දමා තිබේ. ඔහුගේ ධුර කාලයේ දී සිදුවුන ලමයින්ට එරෙහි පලල්ව පැතුරුන ලිංගික කොල්ලයන් සැඟවීමට දෙවන ජුවාම් පාවුලු උත්සාහ කල බව දැන් පැහැදිලි ය.

ඇමරිකානු, අයර්ලන්ත, ඕස්ට්‍රියානු සහ අනෙකුත් පල්ලිවල මෙම අපචාර සැඟවීමේත්, අනතුරුව ඒවා එලිමහනට පැමිනිවිට ඒවායේ වැදගත්කම අඩු ලංසුගත කිරීමේත් ඔහුගේ භූමිකාව, ලිංගික චාරිත්‍ර වාරිත්‍ර පිලිබඳ ප්‍රශ්නවලදී වතිකානුවේ කුහක ව්‍රතය සනිටුහන් කරයි. සාමාන්‍ය ජනයාගේ ස්වභාවික ලිංගික භාවිතාවන් පිලිබඳව පල්ලියේ තොරක් නැති සදාචාරකරනයට තියුනුව ප්‍රතිවිරෝධීව එය පිහිටන අතර දෙවන ජුවාම් පාවුලුගේ ද සමස්තයක් ලෙස වතිකානුවේ ද මූලික සැලකිල්ල වූයේ පූජක කුලය හා එහි බලය, අධිකාරය හා පරීක්ෂාවන්ගෙන් මුක්ත වීම බව සනිටුහන් කරයි.

දෙවන ජුවාම් පාවුලු, පල්ලියට වූ ජනසහයෝගයේ දිග් ගැසුන ගරාවැටීම යම් තරමකට නවත්වා ගැනීමට හා ආයතනය එකට මාට්ටුකර තබාගැනීමට හැකි වූ සිත් ඇද බැඳගත් චරිතයකි. ඔහුගේ වියෝවීම, මෙම පෞරානික, ඇතුලතින් කුනු වූ, ප්‍රතිගාමී ආයතනයට එන අභ්‍යන්තර හා බාහිර පීඩනය තීව්‍ර කරනු ඇත. දෙවන ජුවාම් පාවුලුගේ මරනය පල්ලිය නංවා තැබීමට පාවිච්චි කිරීම පිනිස මාධ්‍යය විකාර සහගතව ගමන් කරන දුර ප්‍රමානය ම, එම ආයතනයේ ද එය ආරක්ෂා කරන ධනේශ්වර පර්යායේ ද අර්බුදයේ පරස්පර විරෝධී වූ ප්‍රකාශනයකි.

©
www.wsws.org